කැලණිය අධ්‍යාපන කලාපය
දෙවන වාර පරීක්ෂණය - 2015
සිංහල භාෂාව හා සාහිත්‍යය

6 ශ්‍රේණිය | කාලය පැය 2 යි

I පත්‍රය

- මෙම පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 40කි.
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

- 1, 2, 3 ප්‍රශ්නවල ඉරි ඇඳි කොටසේ **අර්ථයට වඩාත් සමීප අර්ථය** දෙන ප්‍රකාශය තෝරා යටින් ඉරක් අඳින්න.

1) අම්මා ඉඳුල් වතුර භාජනය ගෙන ගොස් කෙටල ගාලට හැළුවා ය.
1. හරක් බඳින මඩුවට
2. ජලය ආශ්‍රිතව වැවෙන පඳුරු විශේෂයක් සහිත බිමට
3. පලා වර්ග වැවෙන තැනට
4. කටු පඳුරු සහිත බිමට

2) ගම්මානයේ දෙණි පතක පිහිටි කුඩා පැල්පත අමුතු සිරියාවක් ගෙන දුන්නේ ය.
1. කඳු දෙකක් අතර පිහිටි බිම් කොටස
2. කැලෑ ප්‍රදේශයක්
3. දිය සීරාව ඇති තැනක්
4. කුඹුරු අයිනේ පිහිටි බිමක්

3) ඉඩෝර කාලයට ගම් වැසියන් වැවේ කුඩා ළිං තනා ඔවුන්ට අවශ්‍ය ජලය ලබා ගන්නේ මහත් අපහසුවෙනි.
1. නියං සමය
2. වැසි සමය
3. මෝසම් සමය
4. වාරකන් සමය

- 4, 5 ප්‍රශ්නවලට මුලින් දී ඇති පදයට **සමානාර්ථ නොදෙන** පදයට යටින් ඉරක් අඳින්න.

4) සමීපය :- 1. කිට්ටු 2. අසල 3. නුදුරු 4. ඈසුරු
5) සිත :- 1. චිත්තය 2. මනස 3. හදවත 4. මන

- 6, 7 ප්‍රශ්නවලට මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථය** දෙන පදයට යටින් ඉරක් අඳින්න.

6) චංචල :- 1. සසල 2. නිශ්චල 3. චල 4. සෙලවෙන
7) අභ්‍යන්තර :- 1. ඇතුළත 2. බාහිර 3. මධ්‍යම 4. නේවාසික

8) "ව්‍යාපෘතිය" යන පදයෙහි පිල්ලම් නිවැරදි ව යෙදෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.
1. යංශය, ඇදපිල්ල, ඉස්පිල්ල
2. යංශය, ගැටපිල්ල, ඉස්පිල්ල
3. ගයනුකිත්ත, ගැටපිල්ල, ඉස්පිල්ල
4. යංශය, ඇලපිල්ල, ඉස්පිල්ල

- 9, 10 යන ප්‍රශ්නවල සෑම පදයක ම **නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත** පද පේළිය යටින් ඉරක් අඳින්න.

9) 1. මීත්තනිය, සිද්ධස්ථානය, ආකර්ෂණීය
2. ශුභාශිංසනය, ලේඛකයා, සම්භාව්‍ය
3. සම්ප්‍රධාය, පක්ෂියා, නිර්මාණය
4. අලුත්, කැලඹුණු, විශිෂ්ට

10) 1. නිධානය, විචිත්‍රභාවය, ළපටි
2. ප්‍රණීත, අග්ගලා, ස්වභාවධර්මය
3. පිළිවෙළ, ආවේනික, සංරක්ෂණය
4. විදේශික, මහළු, ථූපවංශය

- 11 සිට 15 තෙක් ඇති වාක්‍යයන් හි ඇති හිස්තැන්වලට ගැළපෙන වචනය වරහනින් තෝරා එයට යටින් ඉරක් අඳින්න.

11) ගෙවිලිය මිරිස් .......................... (පැල/පැළ) සිටුවා .......................... (පැලට/පැළට) ගියා ය.
12) මාළු .................... (කද/කඳ) ඔසවා ගත් කත්කාරයා වෙහෙස නිවා ගැනීමට කොස් .................... (කද/කඳ) උඩ වාඩිවිය.
13) වීදිවල .......................... (සරන/සරණ) දරුවන්ට කාගේ .......................... (සරන/සරණ) ද?
14) සැදෑ .................... (කල/කළ) උදාවෙද්දී ගැහැනු .................... (කල/කළ) උකුලේ තබා ගෙන ළිඳට යති.
15) අත්තම්මා පිඩු සිඟා වැඩි හාමුදුරුවන්ට ................ (දන/දණ) පිළිගන්වා .............. (දන/දණ) ගසා වැන්දා ය.

- 16 සිට 20 තෙක් ඇති වාක්‍යවල හිස්තැනට ගැළපෙන වචනය වරහනින් තෝරා යටින් ඉරක් අඳින්න.

16) .......................... (ගුරුවරු/ගුරුවරුන්) දරුවන්ට යහමග කියා දෙති.
17) අම්මා මල් පොකුරු කඩා නංගී අතට .......................... (දුන්නා ය./දුන්නේ ය.)
18) සිංහ කොඩිය අහසේ .......................... (ලෙළදෙති./ලෙළදෙයි.)
19) සිංහයා තම පුතා සොයමින් කැලය දෙවනත් .......................... (කළහ./කළේය.)
20) .......................... (අපි/අප) දළදා පෙරහැර නැරඹීමට ගියෙමු.

(ලකුණු 02×20 - 40)

## II පත්‍රය

- 1, 2 ප්‍රශ්න **අනිවාර්යය වේ.**
- 3, 4, 5, 6 ප්‍රශ්නවලින් **තුනකට** පිළිතුරු සපයන්න.

1) පහත සඳහන් මාතෘකාවලින් **එකක්** තෝරා ගෙන වචන 125 - 150 අතර වන සේ රචනයක් ලියන්න.
   1. සුන්දර උදෑසනක්
   2. දේශීය ආහාරවල වැදගත්කම
   3. සිත නිවන ජන කවි
   4. මා කැමති ලේඛකයා
   5. හොඳ සිරිත් පුරුදු වෙමු. (ලකුණු 16)

2) පසුගිය නිවාඩුවට ඔබ පවුලේ සියලු දෙනා වැදි ගම්මානයක් බැලීමට ගියේ යයි සිතා එහි විස්තර දන්වා මිතුරෙකුට/මිතුරියකට ලිපියක් ලියන්න. (ලකුණු 14)

3) පහත සඳහන් පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සැම වරද තිබුණත් හිමියනේ මට
කැම රස බොජුන් දුන්නෙම් සොඳ රුවට
බෝම එපිට වඩිනා හිමය පසු කොට
සැම සියලු දෙවියෝ පිහිටයි ඔබට .

කැලේ තිබෙන කොයි දේ වත් රසවේවා
මලේ බමරු මෙන් පිරිවර ඇතිවේවා
අව්වේ තිබෙන රැස් මාලා අඩුවේවා
ගව්වෙන් ගව්ව දිව මාලිග සෑදේවා

   i. පද්‍යයෙහි සඳහන් වනාන්තරය කුමක් ද?
   ii. මෙහි සඳහන් ආකාරයට පිහිට ප්‍රාර්ථනා කරන්නේ කවුරුන්ගෙන් ද?
   iii. මෙහි සඳහන් උපමාව දැක්වෙන කවි පාදය උපුටා ලියන්න.
   iv. හිරුගෙන් පීඩාවක් නොවේවා යන අදහස දෙන කවි පාදය උපුටා ලියන්න.
   v. ආහාර යන පදයෙහි අර්ථය හැඟවෙන පද දෙකක් පද්‍යයෙන් සොයා ලියන්න. (ලකුණු 02×05 - 10)

4) පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨවල අවස්ථා සම්බන්ධය ලියන්න (කවුරුන් විසින් කා හට කියන ලද්දේ ද?).
   i. "මේවා ගස්වලින් කඩා ගන්නා දෙයක් ද?"
   ii. "අම්මව එක්ක යන්නේ මම"
   iii. "පයිං ඇවිදිල්ල
   මහන්සි ද මන්ද"
   iv. "දරුවනි තොප කළ දේ ඉතා යහපතැ"
   v. "ගොහින් බලාපල්ල මගේ වී ගොඩ" (ලකුණු 02×05 - 10)

5) පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨවල අදහස ලියන්න.
   i. කෙනෙහිලිකම්වලින් බේරීමට
   ii. හැලහොල්මනක් නැති ව සිටියේ ය.
   iii. සුමධුර රසයකින් යුක්ත වූ
   iv. මද වශයෙන් මුසු කොට
   v. කඳු ඇදලා දෙපයට සවි නැත ඉතිනේ (ලකුණු 02×05 - 10)

6) පහත සඳහන් වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.
   i. මී මැස්සෝ මී වද බඳිති.
   ii. ළමයෙක් දිය යටට පීනා යයි.
   iii. කොක්කු පියඹා විත් නියර පිට සිටගනිති.
   iv. ගස් සුළඟට වැනෙයි.
   v. අපි වත්ත පහළට යමු. (ලකුණු 02×05 - 10)